# 2.17 බැමිණිතියා සාගතයට ලංකාවාසීන් මුහුණ දුන් ආකාරය පිළිබඳ පර්යේෂණාත්මක විමර්ශනයක්

වී. ඩී. නදීෂා ෂර්මලී ගුණවර්ධන
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

වට්ටගාමිණී අභය රාජ්‍ය කාලයේදී (ක්‍රි.පූ . 103 - 102, 89 - 77) බැමිණිතියා සාගතය පැවතිණි. මේ පිළිබඳව අධ්‍යයනයේදී විශේෂයෙන් සම්මෝහවිනෝදනී අට්ඨකථාව, සීහළවත්ථුප්පකරණය, සහස්සවත්ථුප්පකරණය, රසවාහිනිය වැනි කෘතින් මුලික වශයෙන් උපකාරීවන අතර මීට අමතරව දීපවංසය, මහාවංසය ඇතුළු වංසකථා සහ  නිකායසංග්‍රහයයෙන් ද දායකත්වයක් ලබාගත හැකිවේ.

මුලාශ්‍රය පරිශීලනයේදී පෙනී යන්නේ මෙම දුර්භික්ෂ කාලය වසර 12 ක් පමණ පැවති බවත් මේ කාලය තුළදි ලංකාවාසින්ට දුෂ්කරතාවන් රාශියකට මුහුණ දීමට සිදුවු බවත් ය. බොහෝ ලක්වැසියන් මෙන් ම භික්ෂුන් ද රට අතහැර දකුණු ඉන්දියාව වැනි සමීප රටවලට නැව් නැගි අතර සුළු පිරිසක් මධ්‍ය කඳුකරයට සංක්‍රමණය වී ඇත.

ආහාර පාන පවා සොයා ගත නොහැකිව භික්ෂුන් රෝගී වු අවස්ථා ඉහත මුලාශ්‍රය අධ්‍යනයේදී පසක් විය. මේ අතිශය දුෂ්කර සමයේ දී භික්ෂූන් කරකොළ සමග බත් අනුභව කොට ඇත. මේ කාලයේදී භික්ෂුන්ට මෙන්ම සමාන්‍ය ජනයාට වස්ත්‍ර ලබාගැනීම පවා දුෂ්කර විය. ඇතැම් පවුල්වල දියණිවරුන් උගසට තැබු අවස්ථාවන් ද ලේඛන ගත වී ඇත. බැමිණිතියා සාගතය පැවති කාලයේදී භික්ෂුන් මෙන්ම සාමාන්‍ය ජනයා මුහුණ දුන් දුෂ්කරතා මෙම පර්යේෂණයේදි අධ්‍යයනය කෙරේ.